# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2411/42 - 2024 නොවැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2024.11.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2023/150.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

ජේ. කේ. ඩී. කපිල රොෂාන් මයා., 01 කණුව, මින්නේරිය

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, අංක. 50, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක. 13/30, නීතිඥ සරත් ලියනගේ මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය.

2024 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

1A - G 043102 - 14 (2024/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2023/150.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජේ. කේ. ඩී. කපිල රොෂාන් මයා, 01 කණුව, මින්නේරිය.

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, අංක. 50, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,**

"ලංකා විදුලිබල මණ්ඩලයේ මින්නේරිය ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයේ පාරිභෝගික සම්බන්ධීකාරක ලෙස සේවයේ යෙදී සිටි ජේ. කේ. ඩී. කපිල රොෂාන් මහතා හට අංක AGM(DD1/DGM/C&C/D/HRO/DM138 දරන 2018.05.31දිනැති විනය නියෝගය මගින් ලබා දී ඇති දඬුවම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න, හා එම විනය නියෝගය මගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0127

---

මගේ අංකය: IR/COM/02/2023/154.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

1. එස්. ඩී. රවීන්ද්‍ර සුකුමාල් මයා, අංක. 9/3, නිලනිවාස, මහලේවාය, හම්බන්තොට.
2. එස්. එච්. එන්. චන්දන ද සිල්වා මයා, අංක. 152/3, වලස්මුල්ල පාර, බෙලිඅත්ත.

සහ

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ

ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගාල්ල, කොහොම්බන්වත්ත, අංක. 66/2 ඒ, එච්. ආර්. එල්. සුගතදාස මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය.

2024 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2023/154.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

1. එස්. ඩී. රවීන්ද්‍ර සුකුමාල් මයා, අංක. 9/3, නිලනිවාස, මහලේවාය, හම්බන්තොට.
2. එස්. එච්. එන්. චන්දන ද සිල්වා මයා, අංක. 152/3, වලස්මුල්ල පාර, බෙලිඅත්ත.

සහ

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

“ හම්බන්තොට ලංකා සෝල්ට් ලිමිටඩ් හි සේවය කළ, එස්. ඩී. රවීන්ද්‍ර සුකුමාල් මහතා, 2016.02.18 දින සිට සේවය හැරගියා සේ සලකා කටයුතු කර අනතුරුව 2020.01.08 දිනැති ලිපි මගින් 2016.02.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි හිඟ වැටුප් හා අනිකුත් දීමනා ලබා දෙන බව සඳහන් කරමින් නැවත සේවයේ පිහිටුවීම

හා

එස්. එච්. එන්. චන්දන ද සිල්වා මහතා, 2016.07.09 දින සිට ද සේවය හැරගියා සේ සලකා කටයුතු කර අනතුරුව 2020.01.08 දිනැති ලිපිය මගින් 2016.07.10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි හිඟ වැටුප් හා අනිකුත් දීමනා ලබා දෙන බව සඳහන් කරමින් නැවත සේවයේ පිහිටුවීම සිදු කළ ද, ඔවුන් දෙදෙනා සඳහාම එම කාලසීමාවන්ට අදාළව හිඟ වැටුප් හා දීමනා ලබා නොදීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් දෙදෙනාට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිඳබව වේ.”

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0128

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.